සියලු ම හිමිකම් ඇවිරිණි/All Right Reserved / முழுப் பதிப்புரிமையுடையது

# ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය
# இலங்கை அபிவிருத்தி நிருவாக நிறுவகம்
# SRI LANKA INSTITUTE OF DEVELOPMENT ADMINISTRATION

**ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ නිලධාරීන් සඳහා වන පළමුවන**
**කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2020(I)**

| | | |
|---|---|---|
| කාලය: පැය 03 | පරිපාලනය (02-II) | විභාග අංකය<br>Index No / சுட்டெண்<br>.................................... |

- **ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.**

---

01\. i. රාජ්‍ය සේවයේ කිසියම් තනතුරක වැඩ බැලීම සඳහා පත් කිරීම යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 03)

ii. වැඩ බැලීම සඳහා පත් කිරීමේ අවස්ථාවක දී අවධානය යොමු කළ යුතු කරුණු මොනවා ද? (ලකුණු 05)

iii. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතීන් හි III වැනි පරිච්ඡේදයට අනුව රාජ්‍ය සේවයේ ආදේශක, අනියම්, තාවකාලික සහ ස්ථිර යනුවෙන් හඳුන්වන්නා වූ සේවා තත්ත්වවල විශේෂතා පැහැදිලි කරන්න. (ලකුණු 12)

02\. i. ආයතන සංග්‍රහයේ XLVII පරිච්ඡේදයේ සාමාන්‍ය හැසිරීම පිළිබඳ දක්වා ඇති විධිවිධාන හතරක් (04) දක්වන්න. (ලකුණු 08)

ii. පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරිය සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු පිළිබඳව කෙටියෙන් දක්වන්න.

අ. සංයුතිය

ආ. ධූර කාලය

ඇ. බලතල

ඉ. කර්තව්‍යයන්

(ලකුණු 3x4=12)

03\. i. ආයතන සංග්‍රහයේ XII පරිච්ඡේදයේ සඳහන් වන ආකාරයට රාජ්‍ය නිලධරයෙකුට විශේෂ නිවාඩු ලබා ගත / ලබා දිය හැකි අවස්ථා පහක් (05) නම් කරන්න. (ලකුණු 10)

ii. "නිවාඩු යනු රාජ්‍ය නිලධරයන් සතු අයිතිවාසිකමක් නොව වරප්‍රසාදයකි" පැහැදිලි කරන්න. (ලකුණු 10)

04. පහත සඳහන් මාතෘකා පිළිබඳ කෙටි සටහන් ලියන්න.

අ. යැපීම් දීමනාව

ආ. සාමාන්‍ය හැසිරීම හා විනය

ඇ. පූර්ණ පඩි සහිත විශේෂ නිවාඩුව ලබා දිය හැකි ලෙඩ රෝග

ඉ. උත්සව අත්තිකාරම්

ඊ. ලිපි ගොනු කිරීමේ දී දෙපාර්තමේන්තු ප්‍රධානියෙකුගේ වගකීම

(ලකුණු 5x4=20)

05. i. ලියාපදිංචි වෘත්තීය සමිතියක් යනු කුමක් ද? (ලකුණු 04)

ii. ලියාපදිංචි වෘත්තීය සමිතියක සාමාජිකයෙකුට වෘත්තීය කටයුතු සඳහා සහභාගී වීමට ලබා දී ඇති පහසුකම් කෙටියෙන් සඳහන් කරන්න. (ලකුණු 06)

iii. වෘත්තීය සමිතියක මව් සංගමයේ ප්‍රධාන නිලතල දරන නිලධාරීන් ස්ථාන මාරු කිරීමේ දී ක්‍රියා කළ යුතු ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 10)

06. i. “පත්වීම් බලධාරියා” යන්නෙන් අදහස් වන්නේ කවරෙක් ද? (ලකුණු 04)

ii. රාජ්‍ය සේවයේ පත්වීමක් ලබා ගැනීමට සුදුසු නොවන අය හෝ පුද්ගලයන් කවු ද? (ලකුණු 06)

iii. පත්වීම් ලිපියක අඩංගු විය යුතු කරුණු පහක් (05) දක්වන්න. (ලකුණු 10)

**************